DOI: 10.31357/fhssmst.2005.00051

ශ්‍රී ලංකාවේ

# විකල්ප නාට්‍ය කලාව

එන්.පී. අල්ගෙවත්ත

# ශ්‍රී ලංකාවේ

# විකල්ප නාට්‍ය කලාව

(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යලයේ පශ්චාත් උපාධි පීඨය මෙහෙය වන
නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති පාඨමාලාවේ ස්වාධීන නිබන්ධය)

ලියාපදිංචි අංකය : GS/HU/1694/2002

විභාග අංකය : MA/DT/0042


එන්.පී අල්ගෙවත්ත,

නාට්‍ය හා රංග කලාව අධ්‍යනාංශය,

වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ,

බිංගිරිය .

## පිදුම

ලොව දකින්නට
දෙනෙත් ලබා දුන්
සෙනෙහෙබර
මෑණියන්ට, පියාණන්ට
ශිල්ප කියා දී
නුවණැස පෑදූ
දයාබර
ඇදුරුතුමන්ට, ඇදුරුතුමියන්ට
භක්ත්‍යාදරයෙනි !

# ස්තුතිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙහි සිංහල හා ජන සංනිවේදන අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ට මහාචාර්ය තිස්ස කාරියවසම් මැතිතුමාගේ පාඨමාලා සමායෝජකත්වයෙන් පවත්වන ලද නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති පාඨමාලාවේ ස්වාධීන නිබන්ධනය වශයෙන් මෙය ඉදිරිපත් කරන්නට යෙදුණි.

විශේෂයෙන් මෙම මාතෘකාව අනුමත කර ගැනීමේ පටන් අවසානය දක්වාම මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් දුහුණන් ඥාන වඩනා ජ්‍යෙෂ්ට මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාට හෘදයාංගම ස්තුතිය පුද කරමි.

විෂය කරුණු සොයා ඇවිදිනා විට කරුණු සොයා දුන් ආචාර්ය ගාමිණී හත්තෙට්ටුවේගම, මහාචාර්ය රෝලන්ඩ් අබේපාල , ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන ආදීන්ට සෙනෙහෙ තුති පුදමි. වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නාට්‍ය හා රංග කලාව අංශ අධ්‍යනාංශයේ කථිකාචාර්ය මණ්ඩලයට මෙන්ම පීඨාධිපති එච් එම් චන්ද්‍රසේකර මහතා වෙත ගෞරව ස්තුතිය හිමි වේ.

මාගේ ජිවිතයෙහි සැම කාර්යකදීම ළඟ සිටින දයාබර අම්මාටත් ,ආදරණීය බිරිඳ රසිකා අල්ගෙවත්තටත් සෙනෙහෙබර ස්තුතිය පුද කර සිටින්නෙමි.

# පටුන


| | | |
|---|---|---|
| 1 | හැඳින්වීම | 1 - 3 |
| 2 | විකල්ප නාට්‍ය යනු කුමක්ද | 4 - 12 |
| 3 | වීදි නාට්‍ය කලාව | 13-21 |
| 4 | කෙටි නාට්‍ය කලාවේ ලක්ෂණ | 22-29 |
| 5 | ළමා නාට්‍ය කලාව | 30-52 |
| 6 | විකල්ප නාට්‍ය කලාවේ සංනිවේදන වටිනාකම | 53-58 |
| 7 | විකල්ප නාට්‍ය කලාවේ සමාජ අධ්‍යාපනික වටිනාකම | 59-64 |
| 8 | නිගමන හා යෝජනා | 65-67 |
| 9 | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 68-70 |

# හැඳින්වීම

විකල්ප නාට්‍ය කලාව සමාජ අධ්‍යාපන කාරකයක වශයෙන් යොදාගත හැකිද එය යොදා ගතහැකි නම් යොදාගත යුත්තේ කෙසේද යන කරුණු පිළිබඳව මෙතෙක් කිසිවකු කරුණු අධ්‍යයනය කොට නොමැත . නාට්‍ය අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදා ගැනිමේ වැදගත්කම අද අධ්‍යාපනඥයන් පිළිගන්නා මතයයි. නමුත් සම්මත නාට්‍ය ක්‍රමයට වඩා විකල්ප වූ නාට්‍ය විධින් උපයෝගි කරගෙන දැනුම ලබා දීමට පුළුවන. වර්තමානය වන විට සමාජය තුළින් මෙන්ම පාසල තුළින්ද ආචාර ධර්ම, සාරධර්ම ආදි ගුණාංගයන් ඉවත් වෙමින් තිබේ. දැනුම කුසලතා ආක්ලප ආදිය වර්ධනයට නාට්‍ය උපයෝගි වේ. මෙවැනි පසුබිමක් යටතේ විකල්ප නාට්‍ය කලාව අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදාගැනිම උචිතයැයි දැනේ.

ඉහත ප්‍රකාශයන්ට අනුව විකල්ප නාට්‍ය අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදා ගන්නේද එය යොදාගත හැකිද ඉන් අධ්‍යාපනික වශයෙන් කුමන සේවාවක් සිදුවේද යන්න ගැටළු අප හමුවේ දිස්වෙයි. ඍමවැනි ගැටළු පිළිබඳව මා විසින් අධ්‍යයනය යොමු කරන්නෙමි.

මෙම ගැටළුව පිළිබඳව මෙතෙක් කිසිවෙකු කරුණු ඉදිරිපත් කොට නොමැත . නමුත් නාට්‍ය අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදාගත හැකි බව පෙන්වා දී තිබේ. පාසල් විෂය මාලාව තුළ මෙන්ම සෞඛ්‍ය පරිසර ආදි විවිධ සමාජීය ගැටළු ජනතාව වෙතට ගෙනයාම සඳහා විකල්ප නාට්‍ය භාවිතා කරන බවත් පෙනේ. එසේම මෙය අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදාගත හැකි බවද යොදාගත හැකි ක්‍රම පිළිබඳව ද සොයා බැලිය යුතුව ඇත .

නාට්‍ය කලාව අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදාගන්නේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු දත්ත හමුවුවද, විකල්ප නාට්‍ය සමාජ අධ්‍යාපන කාරකයක් වශයෙන් යොදා ගත් යුත්තේ කෙසේද යන්න පිළිබඳව මෙතෙක් කිසිදු තොරතුරුත් හෝ නිර්වචන හෝ හමුනොවුනි.

මෙම අධ්‍යාපනයේ අරමු වශයෙන්

1 විකල්ප නාට්‍යය: කුමක්දැයි දැන ගැනිම
2 වීදි නාට්‍ය මාධ්‍ය පිළිබඳ අවබෝධය
3 කෙටි නාට්‍ය කලාවේ ලක්‍ෂණ හඳුනා ගැනිම
4 ළමා නාට්‍ය කලාව හඳුණා ගැනිම
5 විකල්ප නාට්‍ය කලාවේ සන්නිවේදන වටිනාකම විමර්ශණය කිරිම
6 විකල්ප නාට්‍ය කලාවේ සමාජ අධ්‍යාපනික වටිනාකම විමර්ශණය කිරිම

මේ අනුව විකල්ප නාට්‍ය වශයෙන් හඳුන්වනු ලබන්නේ කුමක්ද යන්න පිළිබඳව මෙහි පළමු අංකයේදි සඳහන් කරනන්ට යෙදුනි. සම්මත නාට්‍ය කලාවට අමතර තවත් විවිධ වූ නාට්‍ය ප්‍රභේදයන් හමුවේ. මෙය පවතින සම්මත ක්‍රමයට අමතරව දක්නට ලැබෙන සියළුම නාට්‍ය වර්ග විකල්ප යන සංකල්ප යටතේ හැඳින්විය හැක. තේමාවන්ට,ආර්ථිකයට, රංගයට, වේදිකා තාක්‍ෂණයට, ඉගැන්වීමට, ආගමික ප්‍රචාරයට ආදි විවිධ දේ සඳහා විකල්ප වශයෙන් යොදාගත හැක. මේ අනුව විකල්ප නාට්‍ය, කෙටි නාට්‍ය, ළමා නාට්‍ය, වීදි නාට්‍ය, ප්‍රජා නාට්‍ය, වෙසක් නාට්‍ය, පාස්කු නාට්‍ය ආදි වශයෙන් ප්‍රභේද කොට දැක්විය හැක.

ලංකාවේ වීදි නාට්‍ය කලාව 1974 දි ආරම්භ වී ඇත. වීදි නාට්‍ය කලාවට ලෝකයේ දිර්ඝ ඉතිහාසයක් තිබෙන බව පෙනේ. මෙය වීථි මංසන්ධි කඩමණ්ඩි ආදි විවිධ ස්ථාන වල රඟ

දක්වනු ලබයි. වීදි නාට්‍ය කලාවට ආවේණික වූ අංග ලක්ෂණ කිහිපයක්ම දක්නට ලැබේ. වීදි නාට්‍ය මාධ්‍ය විශේෂයෙන්ම යොදාගෙන තිබෙන්නේ දේශපාලන මතවාද, අදහස් උදහස් ආදිය ප්‍රචාරය සඳහාය.

දිගු නාට්‍ය හැරුණු විට කෙටි නාට්‍ය කලාවක් ද දෘශ්‍යමාන වෙයි. දිගු නාට්‍ය හා සන්සන්දනය කරන විට එය වෙනම මාධ්‍යයක් වශයෙන් හඳුනා ගැනිමට පුලුවන.

ළමා නාට්‍ය කලාව [illegible] ලෝකයේ ඉතා දියුණු මදුටමක පවතින අතර එය ලංකාවේද මෑතක පටන් වර්ධනය වෙමින් පවති. විශේෂයෙන් එය ළමයා ඉලක්ක කර ගනිමින් ළමා මනස සඳහාම නිපදවන්නෙකි. මෙහි ප්‍රධාන ප්‍රභේදයන් දෙකක් දක්නට ලැබේ. වැඩිහිටියන් විසින් ළමුන් සඳහා නිෂ්පාදනය කරනු ලබන ළමා නාට්‍ය ළමුන් විසින් ළමුන් සඳහාම නිෂ්පාදනය කරනු ලබන ළමා නාට්‍ය වශයෙනි.

කෙටි නාට්‍ය, ළමා නාට්‍ය හා වීදි නාට්‍ය යන මාධ්‍ය තුන හොඳ සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් යොදා ගැනිමට හැකියාව ඇත. එමෙන්ම සමාජ අධ්‍යාපනික ක්‍රියාවලියේදී මෙම ප්‍රභේදයන් තුන ඉටුකරන මෙහෙය සුළු පටු නොවේ.

විකල්ප නාට්‍ය කලාව පුළුල් ක්ෂේත්‍රයක් කරා විහිදී යන්නෙකි. මෙවැනි කෙටි නිබන්ධනයකින් ඒ සමස්ථ විකල්ප නාට්‍ය කලාවම පිළිබඳ අර්ථ දැක්වීම අපහසුය. මේ අනුව මා විසින් සමාජ අධ්‍යාපන කාරකයන් වශයෙන් විකල්ප නාට්‍ය යන මාතෘකාව යොදා ගත්තද එයින් විකල්ප නාට්‍ය වන කෙටි නාට්‍ය, ළමා නාට්‍ය හා වීදි නාට්‍ය යන අංග තුන පමණක් සීමා කොට මෙම අධ්‍යයනය දියත් කරන ලදි.

# පළමුවන පරිච්ඡේදය

# විකල්ප නාට්‍ය යනු කුමක් ද

විකල්ප යන්න කෙසේ නිර්වචනය කොට තිබේද යන්න සලකා බැලීමේදී එහි වචනාර්ථය නම් භේදය, කීපයකින් එකක්. සැකය අවිනිශ්චය, විවිධ කල්පනය වෙනස් වෙනස් සැලකීම, වශීය ආදී ප්‍රභේදයන් පෙන්වාදිය හැකිය. විකල්ප නාට්‍ය කලාවක් පිළිබඳව සැකීමේදී මෙය පවත්නා සම්ප්‍රදායට, පවතින සම්මත ක්‍රමයට පටහැනිව සිදු කරනු ලබන සියලුම දේ විකල්ප වශයෙන් ගැනිය හැක. රටක විකල්ප නාට්‍ය කලාව බිහිවීම සඳහා විවිධ සාධකයන් බලපා ඇත. මෙය ඇත ඉතිහාසයට දිව යන්නකි. නාට්‍ය කලාවේ ඉතිහාසය දෙසට යොමු වීමේදී යම් යම් අවධි හා යුගවල විවිධ හේතු සාදක කොට ගනිමින් විකල්ප නාට්‍ය කලාවක් බිහිවී ඇත.

විවිධ අවධිවල පවතින දේශපාලනික, සමාජික හා ආර්ථික සාධක පසුබිම් කොට ගෙන විකල්ප නාට්‍ය කලාවක් බිහිවී ඇති අතර ලෝක ඉතිහාසයේ මෙවැනි අවස්ථාවන් අධ්‍යයනය කිරීම මෙය අවබෝධකර ගැනීමට අනුබලයක් වෙනු ඇත.

ක්‍රි : පු : 523 පමණ වන විට ඉතා දියුණු තත්ත්වයක පැවති ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභේදයන් වශයෙන් ට්‍රැජඩි හෙවත් ශෝකජනකය , කොමඩි හෙවත් හාස්‍යජනකය, සැටර් යන වර්ගීකරණය පෙන්වාදීමට හැකි අතර මෙහිද පවතින සම්මත නාට්‍ය ක්‍රමයට විකල්පව තවත් නාට්‍ය වර්ග බිහිවී ඇති බව පෙනේ. එනම් මුලින් ට්‍රැජඩි හෙවත් ශෝකජනක පමණක් තිබූ අතර පසුව කොමඩි හෙවත් හාස්‍යජනක හා සැටර් ආදි නාට්‍ය වර්ග බිහිවී ඇත.

විකල්ප යන්නෙහි අර්ථය වෙනස් වන්නට පුලුවන. ලංකාවේ නාට්‍ය කලාව දෙස විමසීමේදී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ශෛලිගත නාට්‍ය වර්ගයට විකල්ප වශයෙන් සුගතපාල ද සිල්වා මහතා තාත්වික නාට්‍ය නිෂ්පාදනය කොට ඇති අතර මේ ශෛලිගත හා තාත්වික යන දෙකට අතර මැදි නාට්‍ය ශෛලියක් අනුගමනය කරමින් දයානන්ද ගුණවර්ධන මහතා නාට්‍ය නිෂ්පාදනය කර තිබේ. මේ අනුව අප විසින් හඳුන්වන සම්මත නාට්‍ය සම්ප්‍රදාය හෙවත් මහාධාරාව තුලින් මෙවැනි විකල්ප ක්‍රම බිහිවීමට පුලුවන.

ලංකාවේ විසිවැනි ශතවර්ෂයේ ආරම්භ වූ නූර්ති නමින් හැඳින්වෙන නාට්‍ය විශේෂයද පැවති නාඩගම් කලාවට විකල්පව ආරම්භ වූවා යැයි සිතිය හැකිය. නාඩගම්වල පැවති විවිධ දුෂ්කරතාවයන්ට විකල්ප වශයෙන් නූර්ති ජනප්‍රිය වන්නට ඇත.

නූතනයේ මේ විකල්ප නාට්‍ය යන්න අර්ථකථනය කරීමේදී ප්‍රධාන සාම්ප්‍රදායික ආකල්පයක් බවට පත්වී තිබෙන දැනට සම්මත විදියට වේදිකාවක පෙන්වන යම් යම් රීතීන්ට අනුගත වූ නාට්‍ය සම්ප්‍රදායට පටහැනිව කරනු ලබන තවත් අංගයක් මේ අනුව විකල්ප නාට්‍යය .

- කෙටි නාට්‍යය
- වීදි නාට්‍යය
- ප්‍රජා නාට්‍යය
- ක්ෂණික නිරූපණ
- පාස්කු නාට්‍යය
- වෙසක් නාට්‍යය
- පංති කාමර නාට්‍යය

- ළමා නාට්‍ය
- දෙබස් කතන මුද්‍රා නාට්‍ය (ජගුටා)

ආදී විකල්ප නාට්‍ය කලාව වශයෙන් ගැනිය හැකිය. රටක විකල්ප නාට්‍ය බිහිවීම විවිධ සාධකයන් බලපාන බව ඉහත සඳහන් කෙරිණ. මේ අනුව ඒ ඒ රටවලට අයත් සමාජ ,දේශපාලනික, ආර්ථික හා ආගමික හේතූන් මෙයට බලපාන්නට පුලුවන. මේ අනුව විවිධ දේ සඳහා විකල්ප යොදා ගැනීමද සිදු කළ හැක.

- තේමාවන්ට විකල්පයක්
- පවතින ආර්ථිකයට විකල්පයක්
- රංගයට විකල්පයක් / වේදිකා තාක්‍ෂණයට විකල්පයක්
- ඉගැන්වීමට විකල්පයක්
- ආගමික ප්‍රචාරයට විකල්පයක්
- වේදිකාවට විකල්පයක් වශයෙනි [2]

තේමාවන්ට විකල්පයක් යන්න පිළිබඳ සැලකීමේදී හැත්තෑව දශකයෙහි ලංකාවේ බිහිවු හා අනුව දශකයේ ලංකාවේ බිහිවු නාට්‍ය බොහොමයක් දේශපාලනික , සමාජ වටපිටාව පිළිබඳව අධ්‍යනය කරනු ලබන ගැඹුරු අදහස් රැගත් නාට්‍ය විශේෂයක් බව පෙන්වා දීමට පුලුවන. උදාහරණ වශයෙන් අනුව දශකයේ බිහි වු ධර්මසිරි බණ්ඩාරනායකගේ " යක්‍ෂාගමනය " ජයන්ත චන්ද්‍රසිරිගේ " ඔත්තුකාරයා " විශාකේශ චන්ද්‍රසේකරම්ගේ " තහනම් අඩවිය" ධනංජය කරුණාරත්නගේ " ජූරිය " වැනි නාට්‍ය සඳහන් කළ හැක.

ආර්ථිකයට විකල්ප යන්න පුළුල්ව විමසීමට බදුන් කළ යුතු අංගයකි. මන්දයත් අද නාට්‍යකරුවන් විශාල ආර්ථික අර්බුදයකට පත්ව සිටී. මේ අනුව ඔවුන තම නිශ්පාදන පිරිවැය අඩුකිරීම උදෙසා කෙටි නාට්‍ය වැනි විකල්ප ක්‍රම භාවිතා කරන්නට පුලුවන. එසේම දිගු නාට්‍යයක් වුවත් අඩු නළු නිළි සංඛ්‍යාවක් යොදා ගනිමින් අඩු සම්පත් ප්‍රමාණයක් මගින් නාට්‍ය නිර්මාණය කිරීමට පෙළඹෙනු ඇත .

ප්‍රංශ ජාතික එමිල් සෝලා , හෙන්රික් ඉබ්සන්, ඇන්ටන් චෙකොෆ් , ස්ටැනිස්ලාව්ස්කි , අර්වින් පිස්කැටර් වැන්නන්ගේ රංග රීතියට වෙනස් රංග ක්‍රමයක් බර්ටෝල් බ්‍රෙෂ්ට් විසින් අනුගමනය කර ඇත. ස්වාභාවික නාට්‍ය (Naturalistic Play ) යථාර්තවාදී නාට්‍ය ( Realisstic Play ) වැනි රංග ක්‍රමයන්ට විකල්ප වු තදාත්ම විඝටනය බර්ටෝල් බ්‍රෙෂ්ට් විසින් හඳුන්වා ඇති අතර ප්‍රකාශනවාදය ( Expressionism) අභිතාත්වික වාදය ( Surealism ) යන සම්ප්‍රදායන් දෙකට පටහැනිව බ්‍රෙෂ්ට් ස්වකීය එපික් රංගය හඳුන්වා දී ඇත. [3]

වේදිකාවේ පැවති තාක්‍ෂණික ක්‍රමයන්ට විකල්පව තාක්‍ෂණික විදියක් අනුගමනය කළ අයෙකු වශයෙන් පිස්කැටර් හදුන්වාදිය හැක.

> " ප්‍රොසිනියම් රංග භූමියේ සීමාවන් තරණය කළ පිස්කැටර්
> රංගය සඳහා විද්‍යාවේ සියළු ජයග්‍රහණ එකතු කර ගත්තේ
> ය. කැරකෙන වේදිකාව( Revolving Stage ) ධාවන පටි
> භාවිතය (Conveyorbelts) කැරකෙන පඩිපෙළ

( Esealators ) විදුලි සෝපාන( Elevators ) යාන්ත්‍රික පාලම් , ඉහළ පහළ කළ හැකි උස වේදිකාවන් ආදිය ඔහුගේ නිෂ්පාදන වලදී භාවිතා විය. එවැනි රංග භූමියක් තුළ නළුවාට නාට්‍යයේ කථිකයා හා මග පෙන්වන්නා ලෙස විශාල වෙනසක් කළ හැකිය. ඇම්ප්ලිෆයර් යොදා ශබ්දයේ හා සංගීතයේ හඬ උත්සන්න කිරීම හා ඇතැම් වීට ශබ්ද විකාශන යන්ත්‍ර පවා යොදා ගැනීමට ඔහු පැකිළුනේ නැත. ඇතැම් විට ඔහු සැර විදුලි ලාම්පු වේදිකාව වෙත එල්ල කළේය ''

" මෙබඳු බහු තාක්‍ෂණික ක්‍රම භාවිතය නිසා පිස්කැටර්ගේ නිෂ්පාදන පිටපත ඉංජිනේරුවකුගේ අත්පොතක් මෙන් සටහන් හා සංකේත වලින් පිරී තිබුණි. එක් නාට්‍ය නිෂ්පාදනයකට ඉදිකළ රංග භූමිය කොතරම් බර වැඩිදැයි කිවහොත් කොන්ක්‍රීට් ආධාරක හා යකඩ කම්බි යොදා ගැනීමට සිදු වී යැයි බර්ටෝල් බ්‍රෙෂ්ට් පවසයි." 4

ඉගැන්වීමට විකල්පයක් වශයෙන් යන්න සැළකීමේදී විෂය කරුණු ඉගැන්වීම සඳහා ඉගැන්වීමේදී විකල්ප ක්‍රමයක් වශයෙන් නාට්‍ය යොදාගනු ලබයි. මෙහිදී විවිධ පක්‍ෂයන් මේ අනුව උගන්වයි. සිංහල , බුද්ධ ධර්මය , සමාජ අධ්‍යනය , ඉතිහාසය වැනි විෂයන් මෙන්ම එඩ්ස් පිළිබඳව අවබෝධයක් ලබාදීම . පරිසරය සුරකීම සඳහා අවබෝධයක් ලබාදීම ආදි විවිධ කරුණු දැනුවත් කිරීම සඳහා විකල්පයක් වශයෙන් නාට්‍ය යොදා ගනු ලබයි.

ආගමික ප්‍රචාරයන්ට විකල්පයක් වශයෙන් නාට්‍ය භාවිත කොට ඇත. මෙයට කදිම නිදසුනක් ලෙස මධ්‍යකාලීන යුරෝපීය නාට්‍ය කලාවේ ආරම්භය පෙන්වා දීමට පුලුවන.

" ක්‍රි.ව. 12 හා 13 ශත වර්ෂ වල ප්‍රංශය හා ජර්මනියේත්, අනතුරුව එංගලන්තයෙන් ප්‍රචලිත වු මිස්ටරි නාට්‍ය ආරම්භයේ දී බයිබලයේ කතා තේමා කොට ගෙන දේවස්ථානය තුළ වේදිකා ගත කළ නාට්‍ය වර්ගයකි.එම කතා වලින් අවධාරණය වුයේ දෙවියන් වහන්සේගෙන් ක්‍රිස්තුස් වහන්සේගෙන් ගුප්ත බලයයි.පාස්කු හා නත්තල් සමයේදී දේවස්ථාන වලට රොක් වු බැතිමතුන් ඉදිරියේ මෙම නාට්‍ය පන්වන ලද්දේ දේවබලපරාක්‍රමය එත්තු ගැන්වීම පිණිසය." 5

මේ අනුව විවිධ පරමාර්ථයන්ට විකල්ප වශයෙන් නාට්‍ය යොදාගෙන තිබෙන බව පෙනෙන අතර බොහෝ නාට්‍ය කරුවන් තම දේශපාලන අදහස් උදහස් ජනතාව වෙත සන්නිවේදනය කිරීමේදී නාට්‍ය උපයෝගී කරගත් බව පෙනේ. ඇතැම් යටත් විජිතවල අධිරාජ්‍ය විරෝධී අදහස් උදහස් මතවාද ජනතාව තුළ පැතිරවීම සඳහා නාට්‍ය යොදා ගත්හ. මෙවැනි අවස්ථාවක සංවිධානය වු නාට්‍ය ව්‍යාපාරයක් මගින් එය කළ නොහැකි විය. අවශ්‍යයෙන්ම මෙහිදී නාට්‍ය වාරණයෙන් ද මර්ධනයෙන් ද මුදවා ගත යුතු අතර නාට්‍ය ජනතාව ළගට ගෙන යා යුතු විය. එහිදී නාට්‍යකරුවන්ගේ අවධානය යොමු වුයේ විකල්ප නාට්‍ය කලාවක් පිළිබඳවය. මෙයට නිදසුනක් ලෙස ඇල්ජීරියාව ප්‍රංශ යටත් විජිතයක්ව තිබු අවධියේ ඇල්බයා කැමු කම්කරු පිරිස් සහභාගි කරවාගෙන ඇල්ජීරියර්ස්

නගරයේ ඇරඹු නාට්‍ය ව්‍යාපාරය සඳහන් කළ හැක. [6] මීට අමතරව වියට්නාම ඇමරිකානු යුද්ධ සමයේ වීදි නාට්‍ය ( Street Drama ) බහුලව නිෂ්පාදනය වී ඇත. [7] යුද්ධයේ භීෂණය , සාමයේ පණිවුඩය, ආදරය හා ජීවිතයේ අර්ථවත් භාවය වැනි අදහස් ජනතාවට සන්නිවේදනය කිරීම මෙම නාට්‍ය වල අරමුණ වී ඇත. නාට්‍ය ශාලාවලට ජනතාව ගෙන්වා ගැනීම වෙනුවට නාට්‍ය කරුවන් ජනතාව අතරට ගොස් වීදි මංසන්ධි අසල කෙටි ක්ෂණික නාට්‍ය රඟ දක්වමින් ජනතාව දැනුවත් කළේය. මෙම නිදසුන් වලින් අවබෝධ වන්නේ මෙම නාට්‍ය කළාව පැවති සම්ප්‍රදායික විධිමත් නාට්‍ය කළාවට විකල්ප වශයෙන් යොදාගත් බවකි.

ඉහත දැක් වූ කරුණු වලට අමතර දැනට තිබෙන වේදිකාවෙන් බැහැරව කරනු ලබන නාට්‍ය විකල්ප නාට්‍ය වශයෙන් නූතනයේ හඳුන්වයි. මේවා පිළිබඳ අධ්‍යනය විකල්ප නාට්‍ය යනු කුමක්දැයි යන්න අවබෝධයට ඉවහල් වනු ඇත. නූතනයේ මෙසේ සම්මත වේදිකාවෙන් බැහැරව කරනු ලබන නාට්‍ය වශයෙන් වීදි නාට්‍ය වැදගත් ස්ථානයක් ගනී. ලෝකයේ වීදි නාට්‍ය කලාව කවදා කොතැනක බිහි වූවාදැයි නිශ්චිතව සඳහන් කිරීමට අපහසුය. එය දේශපාලනමය අදහස් උදහස් මතිමතාන්තර සන්නිවේදනය උදෙසා බහුලව යොදා ගෙන තිබේ. ඉන්දියාවේ මෙවැනි වේදිකාවෙන් පිටත පෙන්වන නාට්‍ය, වීදි නාට්‍ය , ගම්වල උද්‍යාන වල ආදියෙහි පෙන්වයි. නාට්‍ය සාර්ථක වන්නට නම් ප්‍රේක්ෂකයා සමඟ සහභාගි ගනු දෙනුවක් දිගට පවත්වා ගත යුතුය. නැතිනම් එය නියම විකල්පයක් නොවේ. ඉන්දීය ඇතැම් වීදි නාට්‍ය කණ්ඩයම් මාස ගණනක් ගමක නැවතී සිට එම ගමෙහි වැසියන්ගේ ආකල්ප අදහස් උදහස් ආදිය හොඳින් හඳුනාගෙන ඔවුන්ට සරිලන අන්දමින් නාට්‍ය නිර්මාණය කොට පෙන්වයි. ඉන්දීය නාට්‍ය කරුවන් සඳහන් කරන අන්දමට නියම විකල්පය නම් ප්‍රෙක්ෂකයා සමඟ දිගින් දිගට සහභාගි ගනුදෙනුවක් තබාගෙන නාට්‍යයක් පෙන්වීමයි. [8] නිරායාසයෙන්ම ගම් වැසියන් සමඟ එකට ජීවත් වීමෙන් ඔවුන් නාට්‍ය තුළින් ලැබූ ප්‍රතිපෝෂණය පිළිබඳව නාට්‍ය ශිල්පීන්ට අවබෝධ කර ගැනීමට හැකියාව ලැබෙයි.

ලංකාවේ වීදි නාට්‍ය ගම් , නගර , දුම්රියපොළ , පාසල , විශ්ව විද්‍යාලය , බස්නැවතුම්පොල , කඩමන්ඩිය ආදි විවිධ ස්ථාන වල දී සංදර්ශන පවත්වයි. ඔවුන්ට මෙහිදී සම්මත වේදිකාවේ පෙන්වන නාට්‍ය මෙන් විශාල වියදමක් දරන්නට සිදු නොවෙයි. සම්මත නාට්‍ය ක්‍රමයේ දක්නට ලැබෙන ඇඳුම් වලට , වේදිකා පසුතල වලට, අංග රචනයට ආදි තාක්ෂණික හා ශිල්පීය අංගයන්ට විකල්පව වීදි නාට්‍යකරුවන් නිර්මාණයන් සකස් කොට ගෙන තිබේ. වේදිකා පසුතල හෝ රංග භාණ්ඩ යැයි විශේෂ යමක් දක්නට නැත. සමහර විට රංගන ශිල්පීන්ම වේදිකා පසුතල වශයෙන් , රංග භාණ්ඩ වශයෙන් භාවිතා කරනු ලබයි. අංග රචනය දක්නට නැති නමුත් ඇතැම් කණ්ඩායම් වෙස් මුහුණු පළඳියි. ඇඳුම් වශයෙන් භාවිතා කරන්නේ විශේෂයෙන් එම චරිත සඳහා නිමවූ ඒවා නොව අවස්ථාව අනුව සකසාගත් ඇඳුම්ය. මේ අනුව වීදි නාට්‍ය කලාව සම්මත වේදිකා නාට්‍යට විකල්පව බිහි වූ නාට්‍ය කලාවක් වශයෙන් හැඳින්වීම යුක්ති යුක්තය.

කෙටි නාට්‍ය ද විකල්ප නාට්‍ය ගොන්නට දමා කතා කිරීමට පුලුවන. හුදෙක් එය ප්‍රොසීනියම් වේදිකාවේ රංග ගත වුවද දිගු නාට්‍ය කලාවෙන් වෙන් වූ නමුත් සුවිශේෂ කලා අංගයකි. එයටම ආවේණික වූ ලක්ෂණ වලින් යුක්තය. කෙටි නාට්‍ය යනු දිගු නාට්‍යයක් කාලයෙන් කෙටි කොට පෙන්වීමක් නොවේ. දිගු කොටසකින් එය වෙනස් වන්නේ කාලය කෙටි නිසාම නොවේ. මූලික වශයෙන් එය ඒකාංගංකය , දිගු නාට්‍යක මෙන් බොහෝ සිද්ධීන් ඒ තුළ කතා කිරීමට නොහැක. කාලය කෙටි බැවින් කතා කළ යුතු දෙය ඊගහක වේගයෙන් කියා අවසන් කළ යුතු ය. සතර මායිම් ඇසීමට කාලයක් ඒ තුළ ඉතිරි වී නැත. කෙටි නාට්‍යයක් නිෂ්පාදනයට දිගු නාට්‍යයට මෙන් විශාල පරිශ්‍රමයක් දරන්නට සිදු

නොවෙයි. එහි භාවිතා කරනු ලබන සියළු අංග දෙස බැලීමේදී ඒවා පහසුවෙන් ගෙන යා හැකි මෙන්ම වියදම අවම කර ගැනීමෙන් නාට්‍ය දර්ශනයක් පැවැත්විය හැකි යැයි හැගේ. කෙටි නාට්‍ය විවිධ සංනිවේදන අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබයි. කෙටි නාට්‍ය දිගු නාට්‍යයෙන් වෙනස් වු කලා අංගයක් බැවින් එය විකල්ප නාට්‍ය කලාවක් වශයෙන් සැලකේ.

ප්‍රජා නාට්‍ය යනුවෙන් හදුන්වනු ලබන නාට්‍ය කලාවක් ද අප රටෙහි තවත් දක්නට ලැබේ. මෙය විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශ වල බහුලව දක්නට ලැබෙයි. විහාරස්ථාන ආශ්‍රිතව, ගම ආශ්‍රිතව රඟ දක්වන මෙම නාට්‍ය දෙබස් කතන මුදා නාට්‍ය හෙවත් ජඟුටා යන නම් වලින් ද හඳුන්වනු ලබයි. මෙය රඟ දැක්වීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද වේදිකාවක් දක්නට නැත. ලණු හෝ කම්බි වලින් සීමාවක් වෙන් කර ගත් පොළව රංග භූමිය වශයෙන් භාවිතා කරනු ලබයි. බොහෝ විට ඔවුන්ගේ තේමාවන් වන්නේ රජවරුන්ගේ පුවත් හෝ පුරාවෘත්තයන්ය. හාස්‍ය මුසු දෙබස් බහුලව යොදා ගන්නා අතර සමාජයේ විවිධ කොටස් නිර්දය විවේචනයට ලක් කිරීමක් ද මෙහිදී දක්නට ලැබේ. සංස්කෘත නාට්‍යවල විදූෂක මෙන් මෙහිද විකටයෙකු යොදා ගනු ලැබේ. මෙහි යම් තරමකට සොකරි කෝලම් වැනි පැරණි ජන නාටක වලින් ආභාෂය ලබාගෙන ඇති බවක් පෙනේ. වේදිකා සැරසිලි වශයෙන් කිසිවක් භාවිතා නොකරයි. නමුත් රංග භාණ්ඩ වශයෙන් යම් යම් දේ භාවිතා කරනු ලබයි. මේ අතර රජු සඳහා භාවිතා කරන ආසනය වැදගත්ය. නාට්‍යට අවශ්‍ය ඇඳුම් මෙහි වැදගත් කමක් දරයි. ස්වභාවික අන්දමින්ම එම චරිතයේ ස්වභාවය දැක්වීම සඳහා ඒ චරිතයට ගැලපෙන අයුරින් ඇඳුම් සකසා ගෙන ඇත. සරුවල පිත්තල වැනි දේ අලවා ඇඳුමට දීප්තියක් ලබා දී ඇත. වේශ නිරූපණය අතින් එතරම් විශේෂත්වයක් නොදැක්වුවද සාමාන්‍ය වශයෙන් වේශ නිරූපණය ද භාවිතා නොකරනවා ද නොවේ.

පාස්කු නාට්‍ය කතෝලික බැතිමතුට විශේෂිත වු කලාංගයකි. දූව, පිටිපන ආදී පෙදෙස් වලදි අද වුවද දැක ගැනීමට ලැබෙති. වර්තමානයේ පාස්කු නාට්‍ය ජීවමාන නළු පිරිසක් විසින් රඟ දක්වනු ලබයි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් දක්වන පරිදි බොරලැස්ස පාස්කු නාට්‍ය විවිධ අංගයන්ගෙන් පෝෂණය වු නාට්‍ය විශේෂයකි.

> " බොරලැස්ස පාස්කු නාට්‍යය සඳහා රංග භූමිය තනනු ලැබුයේ මධ්‍ය වේදිකාවක් හා දෙපසෙහි දෙකක් බැගින් පිහිටුවන ලද තවත් වේදිකා සතරකින් යුක්තවය. ප්‍රධාන ජවනිකා රඟ දක්වනු ලැබුයේ මධ්‍ය වේදිකාවේය. ඊට යාබදව දෙපසෙහි පිහිටි වේදිකා දෙකෙහි වීථි ජවනිකා ද දෙකෙළවර පිහිටි වේදිකා දෙකෙන් එකක පොන්තියුස් පිලාත් ඉදිරියෙහි කරන නඩු විභාගයක් අනනායුස් ඉදිරියෙහි කරන නඩු විභාගයක් දක්වන ලදි. නාට්‍ය ආරම්භයෙහි යේසුස් වහන්සේ සෙරූ සෙලම් නගරයට සපිරිවරින් පිවිසෙන සැටි දක්වන අවස්ථාවෙහි මෙන් ඇතැම් විට වේදිකා පහම එකවර පාවිච්චි කරනු ලැබිය. පසු බිමට විචිත්‍ර පට යොදා තිබුණි".[9]

සරච්චන්ද්‍ර මහතා පෙන්වා දෙන අන්දමට එය වර්ධනීය නාට්‍ය ලක්ෂණ වලින් හෙබි නාට්‍ය කලාවක් බව පෙනේ.

ලංකාවේ විවිධ නගර වල හා ගම් වල අදටත් වෙසක් කාල වලදී රඟ දක්වන නාට්‍ය විශේෂයක් තිබේ. මේවා වෙසක් නාට්‍ය නමින් හඳුන්වයි. වෙසක් නාට්‍ය සඳහා මුල් කාලයේ වඩාත් ප්‍රසිද්ධව පැවතියේ අම්බලන්ගොඩ නගරයයි. අම්බලන්ගොඩ මුල් කරගෙන දකුණු පළාතෙන් කොළඹ නගරය මුල් කරගෙන බස්නාහිර පළාතෙන් වෙසක් නාට්‍ය ව්‍යාප්තිය ඇති වී තිබේ. පසු කාලීනව ලංකාව පුරාම ව්‍යාප්ත වු බවක් දක්නට ඇත. වෙසක් නාට්‍ය වල ඇතැම් අවස්ථාවල නාට්‍යානුසාරයෙන් විවිධ ජවනිකා රඟ දක්වන අවස්ථාවන්ද දකින්නට පුලුවන. විශේෂයෙන්ම විහාරස්ථාන ආශ්‍රය කොටගෙන පොහෝ දිනවල විවිධ ජාතක කතා සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ රඟ දක්වන අවස්ථා තිබුණි. මීට අමතරව වෙසක් තොරණ ආශ්‍රිත වෙසක් නාට්‍ය රඟ දක්වනු ඇත.

පංති කාමරයේදි විවිධ විෂයන් ඉගැන්වීම සඳහා නාට්‍යානුසාරී ක්‍රම භාවිතයට ගනී. පංති කාමරයේදී ඒකාකාරී දේශන හා සාකච්ජා ක්‍රමය හේතුවෙන් පාඩම නීරස වී සිටින ළමුන්ට හොඳ ඉගැන්වීම් ක්‍රමයක් වශයෙන් භාවිතා කරන්නට පුලුවන. අද බොහෝ ගුරුවරුන් ප්‍රාථමික පංති මෙන් හත , අට වසර සඳහා ද මේ ඉගැන්වීම් ක්‍රමය බහුලවම යොදා ගනි. මෙහිදි වේදිකාවේ දක්නට තිබෙන නාට්‍යක සියලු ලක්ෂණ දැකීමට හෝ පංති කාමර නාට්‍ය තුලින් එවැනි දෙයක් බලාපොරොත්තු විය නොහැකිය.

> " මෙහිදී ඇත්ත වශයෙන්ම භාවිතා කළ යුත්තේ පූර්ණ නාට්‍ය ක්‍රමය නොවේ. එහි අංගයක් වන නිරූපණය, රංගනය , සංවාද , තත්ත්වානුරූපණ , නිහඬ චලන , කේවල ගී සාමුහික ක්‍රියාකාරීත්ව ආදිය වේ. වචන භේද , පුරුෂ භේද කාල භේද, ක්‍රියාපද හෝ විභක්ති යනාදිය යම් ව්‍යාකරණ විධියක් සිසුනට පැහැදිලිව කිරීමේදී ඒ ඒ ව්‍යාකරණ විධියට ගැලපෙන පරිදි නාට්‍යමය ක්‍රියාකාරකම් සකස්කර ගත යුතුය. සිසුන් කිහිප දෙනෙකු තෝරාගෙන ඔවුනගේ සංවාද හෝ ක්‍රියාවන් තුලින් අනෙක් ළමයින් තුළ පැහැදිලි අවබෝධයක් ඇති කළ හැකිය. " [10]

ඉහත සඳහන් කරන්ට යෙදුන සියළුම නාට්‍ය වර්ගයන් විකල්ප නාට්‍ය වශයෙන් සැලකීමට හැකි බව පෙනේ. මා එසේ අනුමාන කරනු ලබන්නේ දැනට තිබෙන ශාලාවෙන් හෙවත් ප්‍රොසීනියම් වේදිකාවෙන් පිටත පෙන්වන ( දිගු නාට්‍ය නොවන ) නාට්‍ය විකල්ප නාට්‍ය වශයෙන් සලකන බැවිනි. රටක හොඳ නාට්‍ය කලාවක් බිහිවීම සඳහා මෙම විකල්ප නාට්‍ය කලාවෙන් මහත් පිටුවහලක් ලැබෙනු ඇත. මේ පිළිබඳවත් විමසීම වැදගත් යැයි සිතේ.

නුතන නාට්‍ය විචාරකයෙක් වන අයිෆර් එවන්ස් ( Ifor Evens) පෙන්වා දෙන්නේ නාට්‍ය " සම්මිශ්‍රිත කලාවක් " වශයෙනි. නාට්‍ය සාමුහිකව සිදු කර ක්‍රියාවක් බැවින් එය සඳහා විවිධ පුද්ගලයන්ගේ දායකත්වය අවශ්‍ය වේ. වේශ නිරූපණ ශිල්පීන් , වේදිකා ආලෝක ශිල්පින් , නළු නිළියන් , සංගීත ශිල්පින් , දර්ශන සංවිධායකයින් එපමණකුදු නොව අනිවාර්යයෙන්ම ප්‍රේක්ෂකයන්ද අවශ්‍ය වේ. මේ අනුව නාට්‍යයක් පිටපත රචනයේ පටන් ප්‍රේක්ෂකයන් අතරට ගෙනයාම දක්වා මහා කළමණාකාරීත්වයක් අවශ්‍ය වේ. වෙනත් ප්‍රසාංගික කලාවක් මෙන් නොව නාට්‍යයක් පවතින්කේ ප්‍රේක්ෂකාගාරයක් ඉදිරියේ එය රඟ දැක්වෙන මොහොතේ පමණී. මේ හේතු පාඨය මත නාට්‍ය කෘතියක් නිර්මාණය වන මොහොත අහඹු ලෙස සිදු වන්නක් නොවේ. නාට්‍ය නිර්මාණය කෙරෙන හා ප්‍රේක්ෂකයා විසින් වින්දනය කරණු ලබන අවස්ථාව දක්වා එය සුසැදි තිබෙන්නේ සමාජයේ